# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 12,135 — 1960 මැයි 24 වැනි අඟහරුවාද — 24.5.1960**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

**1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාව**

1949 අංක 48 දරණ ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) සංශෝධන පනතේ 6 වැනි වගන්තියෙන් සංශෝධනය කරනු ලැබූ, 1946 ලංකා (පාර්ලිමේන්තු මැතිවරණ) රාජසභා ආඥාවේ 9 (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව ක්‍රියා කරමින්, ස්වදේශ කටයුතු සහ ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යවර, මොහමඩ් කාසීම් මොහමඩ් කලීල් වන මම, මෙහි යා කොට ඇති උපලේඛනයේ I වැනි තීරයේ සඳහන් මැතිවරණ කොට්ඨාශවලට, එහි II වැනි තීරයේ දැක්වෙන සහකාර ලියා පදිංචි කිරීමේ නිලධාරිතැන මෙයින් පත් කරමි.

ඇම්. සී. ඇම්. කලීල්,
ස්වදේශ කටයුතු සහ ග්‍රාම සංවර්ධන
පිළිබඳ ඇමති.

1960 මැයි 23 වැනි දින,
කොළඹ දීය.

### උපලේඛනය

| I<br>මැතිවරණ කොට්ඨාශය | II<br>සහකාර ලියා පදිංචි කිරීමේ නිලධාරි තැන |
|---|---|
| අංක 1—උතුරු කොළඹ<br>අංක 2—මැද කොළඹ<br>අංක 3—බොරැල්ල<br>අංක 4—දකුණු කොළඹ<br>අංක 19—දෙහිවල-ගල්කිස්ස | සහකාර ලේකම්, අධ්‍යාපන සහ සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය |

---

**1950 අංක 25 දරණ ආහාර පාලන පනත**

**4 (1) වෙනි වගන්තිය යටතේ නියෝගය—අංක 150**

1950 අංක 25 දරණ ආහාර පාලන පනතේ 4 (1) වෙනි වගන්තිය යටතේ මට පැවරී තිබෙන බලතල අනුව, කවරෙකු විසින් හෝ ආහාර පාලක විසින් නිකුත් කරණු ලබන අවසර පත්‍රයක බලය යටතේ හා එම අවසර පත්‍රයේ ආකාරයට හැර, කිසියම් ගවයෙකු මෙරටට ගෙන්වීම, ආහාර, වාණිජ හා වෙළඳ ඇමති තැන්පත් මොහොට්ටාල්ලාගේ ඩිංගිරි බණ්ඩා වන මම මෙම නියෝගයෙන් තහනම් කරමි.

ඇම්. ඩී. බණ්ඩා,
ආහාර, වාණිජ හා වෙළඳ ඇමති.

1960 මැයි 23 දින,
කොළඹ දී ය.


ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.

589—ජේ. ඇන්. ආර් 10109—4,100 (5/60)